(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 7(4).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2017 සැප්තැම්බර් මස 29 වැනි සිකුරාදා**

---

## 2017 ඔක්තෝබර් මස 09 වැනි සඳුදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මහ නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## 2017 දෙසැම්බර් මස 04 වැනි සඳුදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

135/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුපියල් කෝටි 400ක වැට් බදු මුදලක් වංචා කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ට ලබා දුන් දඬුවම් එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුද්ගලයන්ට නියම කරන ලද දඩ මුදල් ඔවුන් විසින් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත වැට් බදු වංචාවට සම්බන්ධ බොහෝ පිරිසක් සිටින බවත්;

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් මෙම වංචාවට සම්බන්ධ බවත්;

(iii) ඇතැම් පිරිස් මේ වනවිට රටින් පැන ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) වැට් බදු වංචාවට අදාළ සියලු පුද්ගලයන් පිළිබඳව විමර්ශන කටයුතු සිදුවන්නේද;

(ii) එසේ නම්, එමඟින් අනාවරණය කරගත් පුද්ගලයන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා තරාතිරම කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1219/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළව වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1471/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 දී වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාවට නංවා ඇති ජලසම්පාදන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ජලසම්පාදන ව්‍යාපෘතියේ නම, ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගැනීමට අපේක්ෂිත පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1624/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ආදායමට විශාල ශක්තියක් වන මැණික් කර්මාන්තය ප්‍රධාන වශයෙන් සිදු කරන රත්නපුර දිස්ත්‍රික්කයේ පාරම්පරික මැණික් පතල්කරුවන්ට අද එම කර්මාන්තය අහිමි වී යන බවත්,

(ii) මෙම කර්මාන්තය තුළ මහා පරිමාණයෙන් නියැලි ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක් අතර සම්ප්‍රදායික පතල් කර්මාන්තකරුවා කුලීකරුවෙකු වී තිබීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට බැකෝ යන්ත්‍ර යොදාගෙන කැනීම් කිරීමට මහා පරිමාණ පතල් කර්මාන්තය සඳහා බලපත්‍ර නිකුත් කර තිබේද;

(ii) එසේ නම්, බලපත්‍රලාභීන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) පාරම්පරික පතල් කර්මාන්තය සඳහා බැකෝ යන්ත්‍ර යොදා ගැනීමෙන් සාම්ප්‍රදායික පතල්කරුවාට අසාධාරණයක් මෙන්ම, විශාල පාරිසරික හානියක්ද සිදුවන බව පිළිගන්නේද;

(iv) මෙම තත්ත්වය වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1710/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පොල් ගොවියාට එක් ගසකට රු. 52/- බැගින්, ගස් 8 සිට අක්කර 5 දක්වා "කප්රුක් පුරවර" නමින් සහනාධාරයක් ලබා දුන් බවත්; එම සහනාධාරය වර්තමානයේදී නොලැබෙන බවත් දන්නේද;

(ii) සහනාධාර නොලැබුණු පොල් වගාකරුවන්, එම සහනාධාරය ඉල්ලා 2016 වර්ෂයේ දෙසැම්බර් මස පොල් වගාකිරීමේ මණ්ඩලයේ රත්නපුර කාර්යාලයට ඉල්ලුම්පත් භාරදුන් නමුත්, මේ දක්වා එයට කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් සොයා බලා වහාම පොල් ගොවියාට පෙර පරිදි එම සහනාධාරය ලබාදීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1754/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩුනුවර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටා ඇති ගඩලාදෙණිය, ලංකාතිලක සහ ඇම්බැක්ක යන සිද්ධස්ථාන ඉතා වැදගත් පෞරාණික ලෝක ප්‍රකට ස්ථාන බව පිළිගන්නේද;

(ii) මෙම ස්ථාන නැරඹීම සඳහා දිනපතා දේශීය හා විදේශීය සංචාරකයන් දහස් ගණනක් පැමිණෙන බව දන්නේද;

(iii) මෙම ස්ථානවල පොදු පහසුකම් නොමැති වීම හේතුවෙන් දේශීය හා විදේශීය සංචාරකයන් දැඩි අසීරුතාවයන්ට ලක්වන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ස්ථානවල අඩුපාඩුව පවතින පොදු පහසුකම් කඩිනමින් ලබාදීම සඳහා ඔබ අමාත්‍යාංශය යටතේ කඩිනමින් වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(ii) එසේනම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1799/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ගැටලු නිරවුල් කිරීමේ අරමුණින් "බිම්සවිය" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එය මේ වනවිට ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන්නේද;

(iii) නොඑසේ නම්, "බිම්සවිය" වැඩසටහන ක්‍රියාත්මකවන දිස්ත්‍රික්ක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම "බිම්සවිය" වැඩසටහන කඩිනම් කිරීමේ යෝජනාවක් ඉදිරිපත් වී තිබේද;

(ii) එම වැඩසටහන කඩිනම් කිරීම සඳහා විදේශීය ආධාර ලබා ගන්නේද;

(iii) එසේ නම්, එය විදේශ ආධාරයක්ද; එසේ නැතහොත්, ණය මුදලක්ද;

(iv) එම ආධාරයේ මූල්‍යමය වටිනාකම කොපමණද;

(v) "බිම්සවිය" වැඩසටහන සඳහා ඇස්තමේන්තු කර ඇති මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2435/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කෙටුම්පත් කිරීමට සහ සංකල්පීය පත්‍රිකා සැකසීමට අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් ගෙවීම් කළ තැනැත්තන්ගේ නම් සහ එම එක් එක් පුද්ගලයාට ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?